සිල්වි වලයාල්

යූසිකෝ ගේ මිතුරෝ සත් දෙනා

සිල්වි වලයාල්

යූසිකේ ගේ මිතුරෝ සත් දෙනා

යුසිකේ නමැති පුංචි ළමයෙක් හිටියා.

එයා ඉරිදා දවසට බොහොම කැමතියි. එදාට යුසිකේ උදේ සිට හවස් වන තුරු සෙල්ලම් කරනවා, දුව පැන ඇවිදිනවා. යුසිකේට ඕන වුණා හැමදා ම ඔය විදියට සෙල්ලම් කිරීමට. ඉරිදා දවස වාසය කරන රටට ගිහිල්ලා හැමදා ම ඉරිදාවට එන්නැයි කියලා ආරාධනා කිරීමට තීරණය කළා. සතියේ අනිත් දවස් වෙනුවට ත් හැමදා ම ඉරිදාට එන්නැයි කීවා.

සතියේ දවස් හිරු බැස ගිහිල්ලා නැංගෙන කන්දට එහා ඉන්නවා කියලා යුසිකේ කල්පනා කළා. යුසිකේ උදේට අවදි වන විට හැමදා ම උදේට හිරු පායලා අලුත් දවසක් ඇති වෙනවා. ඉතින් යුසිකේ හිරු පිටුපසින් ගමන් කළා. එයා ඉතින් එහෙම ගිහිල්ලා, ගිහිල්ලා මහා මූකලන් කැලෑවට ආවා. හිරු කොහෙත් ම පෙනෙන්නට නැහැ. වහා ම හිරු සොයා ගන්නට සිතලා යුසිකේ දුවන්නට පටන් ගත්තා. නමුත් මහ මූකලානට සීමාවක් නැහැ. හිරු සැඟවී ගිය හැටි ඔහු දුටුවේ නැහැ.

ඔහොම යනකොට, යනකොට ඔහු කුහුඹි ගුලක් දුටුවා. ඇඳිරි වැටෙන්නට පටන් ගෙන තිබුණු නිසා කුහුඹියෝ ගුල වටා ඇති සියලු දොරටු වසා සිටියා.

"කුහුඹියනේ, කුහුඹියනේ ඉරිදාව ඉන්න රට ඔයගොල්ල දන්නවා ද?" යුසිකේ ඇහුවා.

"අපි ඔය මූකලානේ හැම තැන ම ගිහිල්ලා තියෙනවා. ඉරිදාව ඉන්න රට අපි දැකලා නැහැ. ඔයා කහ කිරිල්ලී සොයා ගෙන ගිහිං අහන්න! එයා දන්නවා" යැයි කුහුඹියෝ කීවා.



යුසිකේ කහ කිරිල්ලී හොයා ගෙන ගියා. එයා කුරුළු කූඩුව අසල ඉඳ ගෙන පැටවුනට දරු නැළවිලි සින්දුවක් කියමින් ඉන්නවා.

"ආයුබෝවන්, කහවන් කිරිල්ලියේ! ඉරිදාව ඉන්න රට ගැන ඔයා දන්නවා ද?"

"නැහැ. මම මුළු දවස තිස්සේ ම පියාසර කරනවා. මගේ පුංචි එවුනට කෑම හොයා ගෙන එනවා. නමුත් ඉරිදාව ඉන්න රට ගැන මම දන්නේ නැහැ. ලොකු ඕක් ගහේ ඉන්න බස්සා දන්නවා ද? එයා. ගෙන් අහල බලන්න. බස්සා ලොකු නුවණක්කාරයා. හැම දෙයක් ම එයාට ඇහෙනවා. රෑට වුණත් ඇස් පේනවා." කහ කිරිල්ලී කීවා.

යුසිකේ බස්සා වෙත ආවා.

"බොහොම ලොකු නුවණ ඇති බස්සාණෙනි! ඉරිදාව ඉන්න රට ගැන ඔයා දන්නේ නැද්ද?"

මුළු දවස තිස්සේ නිදා ගත් බස්සා මේ දැන් තමයි අවදි වුණේ. මොකද දන්නවා ද හවස් වීමට පටන් ගත් නිසා.

"ඉරිදාට මෙතැන් සිට බොහොම දුරයි. නුඹ ඉදිරියට පලයන්. බය නැතුව ඉස්සරහට යන්න ඕන! ඉස්සෙල්ලා ම හමු වන්නේ සඳුදා ඉන්න රට. සඳුදා වැඩ කිරීමට කැමතියි, ආචාරශීලීයි. යුසිකේ සඳුදාගෙන් මග අසා දැන ගන්න!"

ඉතින් ඔහොම ගිහිල්ලා යුසිකේ සඳුදා ඉන්න රටට ආවා.

"ආයුබෝවන් සඳුදාණෙනි! කරුණාකර මට ඉරිදා ඉන්න රටට යන පාර පෙන්වනව ද?"

"සුබ දවසක්! සුබ දවසක් යුසිකේ! ඉරිදා ඉන්න රටට යාමට දවස් හයක් ගත වෙනවා. මම ඔයාට මග පෙන්වන්නම්. ඉස්සෙල්ලා මට මේ පිදුරු ටික එකතු කර ගන්නට උදව් වෙන්න."

යුසිකේ එකඟ වුණා. දෙදෙනා මිතුරන් වගේ වැඩ කළා. හවස් වෙන විට පුසුඹ ඇති ලොකු පිදුරු ගොඩක්, ගොඩ ගැසුවා. යුසිකේට සඳුදා ස්තූති කළේ එයාට යුසිකේ උදව් කළ නිසා. සඳුදා අඟහරුවාදා ඉන්න රටට යන මග පෙන්වා දුන්නා.

යුසිකෝ ආවා අඟහරුවාදා ඉන්න රටට. ඒ වෙලාවේ අඟහරු වැඩට යාමට ලෑස්ති වෙලා හිටියා.

"ආයුබෝවන් අඟහරුවාදා. ඉරිදා ඉන්න රටට යන පාර මට පෙන්වන්න පුළුවන් ද?"

"ඉරිදා ඉන්න රටට යාමට දවස් පහක් ගත වෙනවා. පාර පෙන්වන්න පුළුවන්. නමුත් මම ඉස්සෙල්ලා මේ අලුත් ළමා නිකේතනය හදන්නට ඕන. මෙය ඉක්මනින් හදාගන්නට මට උදව් වෙන්න"

දෙදෙනා එකතු වෙලා බොහොම අගේට අලුත් ළමා නිකේතනය හැදුවා. අඟහරුවාදා යුසිකෝට මග කියා දුන්නේ බදාදා ඉන්න රටට යාමට ය.

"ආයුබෝවන් බදාදා! මට කරුණාකරලා ඉරිදා ඉන්න රටට යන මග පෙන්වන්න!"

බදාදාට ඒ මොහොතේ හදිසි වැඩ තිබුණා. වැටෙන් එළියට පැන්න වසු පැටියෙක් දැග කරන්නට වුණා.

"යුසිකෝ මට මේ දඟකාර වහු පැටියාව අල්ලා ගන්න උදව් කරන්න. පසුව අපි ඔබේ පැනය ගැන කතා කරමු." බදාදා කීවා.

දෙදෙනාම එකතු වෙලා දඟකාර වහු පැටියාව අල්ලා ගත්තා. බදාදා යුසිකේට බොහෝම ස්තුති කළා. යුසිකේ දක්ෂ ලෙස දුව පැන ඇවිදලා වහු පැටියා ඇල්ලීමට උදව් කිරීම නිසා බදාදා සතුටු වුණා.

"ඉරිදා ඉන්න රටට යාමට දවස් හතරක ගමනක්. ඔයා බ්‍රහස්පතින්දා ඉන්න රටට ගිහිල්ලා එයාගෙන් මග අසා දැස ගන්න. එයා පාර හොඳට දන්නවා" බදාදා කීවා.

බ්‍රහස්පතින්දා හිටයේ බදාදාට අල්ලපු රටේ. එයා යුසිකේ එන තුරු බලා හිටියා වගේ කතා කළා.

"යුසිකේ ආයුබෝවන්! ඔයා හොඳ ළමයකු බවත් හැම දෙනාට ම කැමැත්තෙන් උදව් කරන බවත් මට ආරංචි වෙලා තියෙනවා. කොටුවේ තියෙන පාත්තිවල වල් පැළෑටි උදුරා දමලා මල්වලට වතුර ඉහින්න උදව් වෙන්න."

මුල දී නම් යුසිකේට ඒ වැඩ එතරම් හිතට ඇල්ලුවේ නැහැ. මල් පැල යුසිකේට ස්තුති කරනවා වගේ හිස සලන විට, ඔහුට සතුටක් ඇති වුණා. මල් පාත්තිවල වැඩ කිරීමට ඔහු කැමති වුණා. බ්‍රහස්පතින්දා යුසිකේ ගෙන් ලැබුණු උදව් නිසා බොහොම සතුටු වුණා. ඉරිදා ඉන්න රටට යාමට තව ඇත්තේ දවස් තුනකි යි කියලා ඔහු යුසිකේව පිටත් කළා.

ඊළඟට යුසිකේ ආවේ සිකුරාදා ළඟටයි. සිකුරාදා එදා මහ ගොඩක් රෙදි සෝදමින් හිටියා. යුසිකේ බොහොම කමතියි රෙදි සෝදන යන්ත්‍රයට අයත් මිට කරකැවීමට. ඔහු සිකුරාදා කියන්නත් ඉස්සෙල්ලා රෙදි හෝදන යන්ත්‍රයේ මිට කරකැවීමට පටන් ගත්තා. ඉතින් වැඩ හොඳට කළා.

ඉරිදා ඉන්න රටට යාමට තව ඇත්තේ දවස් දෙකක් බව යුසිකේ දැන ගත්තේ සිකුරාදාගෙනි.



යුසිකෝ සෙනසුරාදා වෙත ආවා.

"ආයුබෝවන් සෙනසුරාදා! ඉරිදා ඉන්න රටට යන පාර පෙන්වන්න ඔයාට පුළුවන් ද?"

"තව එක දවසකින් ඔයාට ඉරිදා ඉන්න රටට යාමට පුළුවන් වේවි. ඔයා මට උදව් කරන්න කාමර සුද්ද කිරීමට, නාන ගෙයට තපින්නට දර ගෙන යාමට. ඒ වැඩේට උදව් කරලා ඔයාට ඉරිදා ඉන්න රටට යන්නට ඇහැකි වේවි."

යුසිකෝ ඉක්මනට ඒ වැඩ ටික කරලා දැම්මා. ඊළඟට යුසිකෝ උණු වතුර නාලා පිරිසිදු වුණා. දැන් ඉතින් ඉරිදා හමුවීමට අමුත්තකු ලෙස යාමට පුළුවනි.

ඉරිදා ඉන්න රට හරිම ලස්සනයි. අනික් රටවල්වලට වඩා ඉරිදා අලංකාරයි. යුසිකේ අඳුනන අනිත් දවස් හයක් ඉරිදා හමුවීමට ඇවිත් හිටියා. අනික් අය සතියේ දවස් හය තිස්සේ ම වැඩ කරන නිසා ඉරිදා ඔවුනට ප්‍රශංසා කළා. අනික් දවස්වලට යුසිකේ උදව් කළ නිසා ඒ ගොල්ලන්ගේ වැඩ සපුරා ගැනීමට පුළුවන් වුණු සැටි ඒ ගොල්ල ඉරිදාට විස්තර කළා.

යුසිකේ ඒ නිසා බොහොම සතුටට පත් වුණා. යුසිකේ අනික් අය සමග එක් වී නටන්නට පටන් ගත්තා. හැමදා ම එන ලෙස ඉරිදාට ආරාධනා කිරීමට යුසිකේට අමතක වුණේ මෙසේ ප්‍රීති වුණ නිසා. දැන් හැම දවසක් ම යුසිකේගේ මිතුරන් බවට පත් වෙලා.

සිල්වි වලයාල්

යුසිකෝ ගේ මිතුරෝ සත් දෙනා

ISBN 978-955-1319-38-0

අනුවාදය
දැදිගම වී. රුද්‍රිගු
චිත්‍ර
සිල්වි වලයාල්

නව සකැසුම
මාලක ලලනජීව

ප්‍රකාශනය

සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

මුද්‍රණය
Kanol PRINT

ප්‍රථම මුද්‍රණය 2015

සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

ISBN 978-955-1319-38-0

Rs. 200/-